අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

**කනිෂ්ඨ අංශය** | **සිංහල භාෂා හා සාහිත්‍යඥාන** | **කාලය පැය - 03 යි.**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ii හා iii කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

**01 .** (අ) කෙටි පිළිතුරු සපයන්න.

i. නූතන සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර පිළිවෙළින් ලියා දක්වන්න.
ii. නම්‍ය සහ අනම්‍ය ස්වර වෙන් වෙන් ව ලියා දක්වන්න.
iii. නූතන සිංහල අක්ෂර මාලාවේ දන්තෞෂ්ඨජාක්ෂර කීයද? ඒ මොනවා ද?.
iv. ඝෝෂ අල්පප්‍රාණාක්ෂර අක්ෂර ලියා දක්වන්න.
v. ‘රූපියල’ මෙහි ස්වර ව්‍යඤ්ජන වෙන් කොට ලියන්න.
vi. සඤ්ඤක ‘ඳ’ සෑදී ඇති ආකාරය ලියා දක්වන්න.
vii. “උද්‍යාන” යන පදයෙහි තද්භව ස්වරූපය ලියන්න.
viii. හලන්ත නාම පදයකට උදාහරණ දෙකක් ලියන්න.
ix. ගෞරවාර්ථයේ තද්ධිත පද දෙකක් ලියන්න.
x. පහත සඳහන් පදවල සමාස නාමය ලියන්න.
   - රත්මල්
   - වැඩිහිටිනිවාසය

(ලකුණු 2x10 = 20)

(ආ) කෙටි පිළිතුරු සපයන්න.

i. සිංහලයේ ප්‍රථම **යථාර්ථවාදී නවකතාව** ලෙස සැලකෙන්නේ කුමක් ද?
ii. **බැද්දේගම** නවකතාවේ පරිවර්තකයා නම් කරන්න.
iii. **ගී මයුර සංදේශය** කවර සාහිත්‍ය යුගයට අයත් සේ සැලකේ ද?
iv. **පන්සිය පනස් ජාතක පොත** සංග්‍රහ කරන ලද්දේ කුමන සාහිත්‍ය යුගයේ ද?
v. **සුභාෂිතය** කතුවරයා කවුරුන් ද?
vi. සන්දේශ කාව්‍ය සඳහා ආභාසය සැපයූ **භරතීය** කාව්‍ය කෘතිය කුමක් ද?
vii. **ගණදෙවි හැල්ල, වදන් කවි පොත** රචනා කරන ලද සාහිත්‍ය යුගය නම් කරන්න.
viii. **අයියනායක** කවි පන්තිය කාගේ නිර්මාණයක් ද?
ix. **සද්ධර්මරත්නාවලිය** රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
x. **සද්ධර්මාලංකාරය** රචනා කරන ලද සාහිත්‍ය යුගය නම් කරන්න.

(ලකුණු 2x10 = 20)

## ii කොටස.

**02 .** (අ) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර නැවත ලියන්න.

i. සභාතොමෝ සතුටින් විසිර ගියහ.
ii. කෙනෙක් ඊට පක්ෂ වෙද්දී බොහෝ අය විරුද්ධ වූහ.
iii. දන කැන් වෙහෙර නමදියි.
iv. ගුරුවරු උගන්වද්දී ශිෂ්‍යයෝ අසා සිටියහ.
v. අතීත ලක්වැසියෝ සියල්ලෝ ම ධාර්මිකයෝ වූහ. (ලකුණු 05)

(ආ) නිවැරදි වාක්‍ය නිර්මාණය සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. බොහෝ තනතුරුවලට පත් වන්නෝ (නුසුදුස්සෝ / නොසුදුස්සන්) නොවෙති.
ii. අතීත (රජවරු/ රජවරුන්) විස්මිත නිර්මාණ කළහ යි ඉතිහාසඥයෝ පෙන්වා දෙති.
iii. එක් කෙනෙක් ඊට සහභාගි (විය./ වූහ.)
iv. දෙවියන් වැනි (මිනිස්සු/ මිනිසුන්) එහි වෙති.
v. අයියාත් නුඹත් මමත් එහි (ගියෙහු./ ගියෙමු. (ලකුණු 10)

**03 .** (අ) පහත සඳහන් පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි කොට ලියන්න.

i. පාපිශ්ඨ ii. දිශ්ටිය iii. විශෝධණය iv. විශ්කම්භය v.ශුභාෂිර්වාදය (ලකුණු 05)

(ආ) පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

i . තරුවක් ii. සිංහයාට iii. වඳුරෙක් iv. කපුටාට v. කුරුල්ලෙකුගේ (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පද කුමන නාම පද වර්ගයට අයත් දැ යි නම් කරන්න.

i .සිංහයා ii.වනය iii. නිල් iv. පනින්නා v. අබේසේකර (ලකුණු 05)

**04 .** (අ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කර සන්ධි ක්‍රමය නම් කරන්න.

i .සිහිනිඟ ii. දෑත iii. කොල්ලා iv. වැල්ලම්පිටිය V. වත්තල (ලකුණු 05)

(ආ) පහත සඳහන් ඉරි ඇඳි පදවල විභක්ති නම් කරන්න.

i . සැනසුම ඔබට ඇත මගෙ හද <u>කුටිය තුළ</u>

ii. <u>සිංහයා</u> මුවෙකු මරයි.

iii. ළමයා <u>ඇඳෙහි</u> නිදයි.

iv. විනිසුරු තුමා <u>පැමිණිලිකරුගෙන්</u> මෙසේ ප්‍රශ්න කළේ ය.

V. සිටුවරයා <u>බික්සඟනට</u> මහ දන් දිනි. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් සමාස පද කවර සමාස වර්ගයට අයත් දැ යි නම් ලියා දක්වන්න.

i .කුපුරිස් ii. අඳුරුකුටිය iii. රජපිරිස් iv. ගුරුපඬුරු V. අත්කම් (ලකුණු 05)

## iii කොටස.

**05 .** (අ) පහත සඳහන් සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

i . තුදුස් ii. තෙළෙස් iii. එකුන්විසි iv. සතළොස් V. අටළොස් (ලකුණු 05)

(ආ) පහත සඳහන් ප්‍රස්තාවිත වදන්වල පොදු අර්ථය ලියන්න.

i .වාම්පතුල් ii. බුන්නා iii. සකලයා iv. ඔයනවා V. බක්කප්පච්චි (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවල අර්ථ දක්වන්න

i. කල - කළ ii. නුඹ - නුබ iii. මළ - මල iv. තණ - තන V. පැළ - පැල (ලකුණු 05)

**06.** නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න**.**

| කෘතිය | කර්තෘ | යුගය | අරමුණ |
|---|---|---|---|
| සැළලිහිණිසන්දේශය | | | |
| සද්ධර්මරත්නාවලිය | | | |
| පූජාවලිය | | | |
| සද්ධර්මාලංකාරය | | | |
| සුභාෂිතය | | | |

(ලකුණු 3X5 = 15)

**07.** පහත සඳහන් මාතෘකා අතුරින් **3**කට කෙටි සටහන් ලියන්න

i. වීදාගම මෛත්‍රී හිමි
ii. හංස සන්දේශය
iii. බුදුගුණ අලංකාරය
iv. කෝට්ටේ සාහිත්‍ය යුගය
v. පූජාවලිය (ලකුණු 3X5 = 15)